# නිර්මාණ Nirmana

## වෙසක් මහිම

ආගම් ජාති කුලමල බේදයක් නැති
සොබා දහම ගෙන මැදහත් සිතක ගති
අක් වෙස් කියන අගනා වේසයක් ඇති
වෙසක් සිරිය පතුරයි සිත කවන කිති

වෙසක් මහේ මෙන් සිරියක් සොබා දමේ
වෙන මාසයක දක්නට නැත මෙලක් බිමේ
ලොවුතුරු බුදුවරුන් බුදුවන වෙසක් සමේ
මුළු දියදමම බුදු ගුණ මහිමයට නැමේ

පින්බර බවකි බුදු ගුණ මහිමෙහි ඇත්තේ
බුදු හිමි පින් කඳකි එහි නිම් හිම් නැත්තේ
කවදත් දියදමෙනි බුදුබව හට ගත්තේ
ඒ බුදු අසිරියයි වෙසහෙහි සිරි ගත්තේ

පිබුදුණ බවයි බුදුබව යන්නෙහි අරුත
බුදුවරු පුබුදු වූවොය දිවියෙහි සැමත
කිලුටක් කිසිම බුදු වූ සිතකට නොමැත
සුන්දර බවේ පිළිබිඹුවකි බුදු සිරිත

බුදුවරු පුබුදු වෙන්නා මෙන් වෙසක් මහේ
විසිතුරු කුසුම් පිබිදෙයි තුරුලතා ඉහේ
බුදු ගුණ සුවඳ මෙන් ඒ මල් සුවඳ ඇහේ
ගුණ මල් සුවඳ වැද අවගුණ දුගඳ නැහේ

අනගිම වෙසක් ගන්නා ලොව නිය දහම
වෙසක් මහෙදි සංවේදී හැම සිතම
පිබිදෙයි දුරුව දුක් දොම්නස් දෙන තැවුම
නිවනකි සිතට දුක් දොම්නස් නැති කමම

♦ *මහාචාර්ය ටී. එස්. අබේවික්‍රම*
**Harrow UK**

## සදහම් එළිය ලැබ තුන්ලෝ බැබලේවා !

සුදු සඳ කිරණ ලොව ආලෝකව ගලන
රන්වන් තාරකා දිගඹරයෙ හි දිලුන
සල් මල් පිපුණු ඉම්හිරි සුවඳින් පිරුණ
බුදු සමිඳුන්ගෙ තෙමඟුල අද වෙසඟ දින

සැරසී සුදු වතින් පන්සල වෙත ඇදෙන
සුදු අරලියා වතුසුදු කුසුමෙන් පුදන
ගුම්නද සාදු සාදු අහසට නැගෙන
දහසක් දනන් ඇත සගමොක් සුව පතන

කරුණා මෙත් සිසිල අවිහිංසාව වැදී
මදනල හමා වෙසගේ තුම් සතුට දිදී
තෙල් මල් සුවඳ ගෙන මුදුදුනින් ඇදිලි බැදී
තිලෙවට තිලක වන් හිමි සිරිපා නමදී

ඉපදෙන මැරෙන සත් වග දිගු සස රේදී
කුසලට නැමී ඉන් නෙක පව් මල සෝදී
බුදු බණ අසා නිවනට යන මඟ පැදී
සැනසුම ලබත්වා! ලැබූ මෙම වෙස හේදී

යුද බිම සටන්, වැගිරෙණ ලේ නොදකීවා
ක්‍රෝධය සිතින් වියැකී මෙත ඉතිරේවා
හරි දේ දකින පැණසර ඇස පැදේවා
සදහම් එළිය ලැබ තුන්ලෝ බැබලේවා!

♦ *කරුණා බස්නායක*
**Hampstead London**

## සමු ගැනීමේ වේදනා



ජීවිතයේ සැඳෑ සමයේ
සැරි සරණ ඔබ
එදා මෙදා තුර කළ
අනන්තවත් වූ පින්කම්
නිවන ඔබ අත ලඟටම
ගෙන ආ සෙයකි
මට හැඟෙන්නේ

සැහෙන කලක සිට
පරලොව යන ගමන
ප්‍රිය කළ ඔබ
තවමත් අප අතර ඉන්නේ
අප පිනෙන් දෝ
රන්වන් මැණියෙනි
එහෙත් මා ඔබ ළඟ නැත
සමා වුව මැණියෙනි
දෙපා වැඳ සමු ගනිමි

ඔබ අප පිනෙන්
අප වෙතට සපැමිණී
කුල කුමරිය කුමුදු
ඇගේ මෙත් දයාවෙන්
සැනසුනා ඔබෙ දිවිය

ඇගේ අගනා මෙහෙය
පරපුරේ සතුට විය

අප සිත් සහන් කර
ඔබ හදට මෙත් පුදා
කුමුදු නම් වූ සුමුදු මල
සුවඳවත් කලෙහිය
අප සැමගෙ සිත් සතන්

අසරණ අයට සරණ වී
අන් දුක නිවාලූ ඔබ
පෙර කළ පිනෙන් ලද
ලේලිය ය ඇය මුදු

අප සිව්දෙන බැහැර ඇතත්
අපේ අඩුව මගහැරලා
ඔබෙ දුක සැප නිති බලලා

ඔබ සනසා දිවි රැක දුන්
ඇය දෙව් දුවකි සුරපුරෙන් ආ

ඔබේ අපේ වාසනාව
හෙළි කරමින් අප වෙත ආ
අයිරින් සොයුරිය
කරුණා සේවය හෙළි කරයි
අප පින් කළ බව

එකට ඉන්න සිහින මැවූ
ඔබේ පැතුම් අපේ පැතුම්
නොසිතූ සේ බොඳ වී ඇත
අප ලද දේ එයයි ඇත්ත
බුදු දහමෙන් පසක් කෙරුව

ඔබේ තනියට ඔබ ළඟ මා නැත
දෙපා වැඳ සමුගනිමි
රන්වන් මැණියෙනි
කමා කළ මැන අප උරුම දිවියට

♦ *පුෂ්පා කලුබෝවිල*
**London**



## Wesak

On Wesak night a full-moon stands sentinel,
Sublime, enchanting, benevolent, bonding……
Multitudes of devotees throng the temples,
Before Buddha statues millions of oil-lamps
flickering orange light,
" KIRI-AMMA'S " dressed in white, and children
offer sweet-scented flowers.
Safforn-robed priests recite verses commemorating
Lord Buddha's birth, enlightenment and death.
Multi-coloured lanterns are displayed everywhere.
Pandals depict Buddha's life.
Throughout the land the throb of drums
nd peal of temple-bells resound.

♦ **Denis Jansz - *London NW8***

## මේ දඟ ගෙය බිඳලමු !

ලෝබය මෝහ තණ්හා කෙලෙසුන් පොදිය
පොදි බැඳ තුරුළු කරගෙන මිනිසා නිදිය
බැඳි බැමි ලිහා සසරින් ගොඩවන විදිය
වටහාගන්න ඔහු පෙර කළ පින් මදිය

මහලුව ජරාවට පත්වී නැති වීම
ඔබටත් මටත් සැමටත් වෙයි එක සේම
තරුණව සිටින්නට සිතුවත් හැම දාම
අටලෝ දහම වලකාලන්නද කෝම

කෙස් ටික හැලෙයි ගැලවෙයි ඉතිරිය සුදු වෙයි
ඉස්සරහට නැමෙයි ගත කොන්දද කුදු වෙයි
සම් ඇට නහර පැදුණු සියොළඟ මුදු වෙයි
එක් කෙනෙකුට නොවෙයි මෙය කාටත් පොදු වෙයි

ලොඹුවුණු කටේ ඇත්තේ දත් තුන හතරයි
එක තැන නොවෙයි ඒකත් අතරින් පතරයි
රූපය තියෙන්නේ ටික කලකට විතරයි
කෙම්බිම සොයා යමු පසු කළ යුතු කතරයි

මට යයි මගේ යයි කිසිවක් නැති සේය
බිඳ දා කඩා යා යුතු මේ දඟ ගේය
ඉපදුණු හැමෝටම මරණය පොදු වේය
තිලොවග වීයාණන් දෙසූ දහමද මේය

♦ *රත්නා ලංකා අබේවික්‍රම*
**Sri Lanka**

## වෙසක් ප්‍රාර්ථනා !

දුකින් පෙළෙන සත දුක් දුරුවේවා
බියෙන් සැලෙන සත බිය දුරුවේවා
සොවින් තැවෙන සිත් සොම්නස් වේවා
මගෙ මව්බිම එක පවුලක් වේවා!

මව්පිය දරු සෙනෙහසින් බැදේවා
සිය සිය දෙන නෑ මිතුරන් වේවා
පිය වදනින් දෙසවන් නැහැවේවා
මුවින් මුවට හසරැළි බිහිවේවා!

කලට අවැසි වැසි කලට වසීවා
කෙතක සුවඳ හැම සිතක පිරේවා
නැතේ කියන බස මතු නොඇසේවා
මෙතේ බුදුන් ළඟ සසර නිවේවා!

♦ *පූජ්‍ය ඇල්ලේ ගුණවංශ ස්වාමීන්වහන්සේ*
**ධර්මායතනය කොළඹ 7**

## වෙසක් ගීතය

නිහඬ නිසංසල මහමෙව්නාවේ
වැඩ හිඳිනා බුදුහිමි අනුරුව ළඟ
නිවී නිවී යයි බවුන් වඩන සිත්
සුවය සදා හද මෙත් මුදිතාවේ

සුවඳ සලාගෙන මල් පිබිදීලා
දොරින් දොරට හිමි ගුණ පවසාලා
මෙත් කරුණාවේ සිහිල ගලාලා
සියල් සතුන් ලොව සුවපත් වීලා

තිසා වැවේ සඳ රේබා විසිරී
නුවන් වසා රැදි ගණඳුර නිමවී
දුකින් මුදා මුළු තුන් ලෝ වැසියන්
සවන් පුරා මුණි දම් හඬ පැතිරේ

♦ *සන්ධ්‍යානි සේනාරත්න*
**Surbiton Surrey**
**UK**

## ලෝවිතුරු ගුණ මහිමේ

මෙත් කරුණා මුදිතාවෙන්
ලෝ සත වෙත සුව පතුරා
කෙළෙස් මලින් ලෙවන් මිදූ
සම්බුදු සමිඳේ!

දුක සැප සමබරව දරා
මොහඳුර දුරැරා සව්සත
බියෙන් සැකෙන් ලොවම මිදූ
තිලොවග සමිඳේ!

අමා දම් දියෙන් නැහැවී
බැතින් මල් පුදා වඳිමී
විහිදේ බුදු රැස් වෙසගේ
ලොවිතුරු සමිඳේ!

තුන් ලෝකයෙ දුක දුරුවී
සැනසෙන්නට බුදු සෙවනේ
අමා සිහිලසක් වේවා!
සම්බුදු සමිඳේ!

♦ *ධම්මි විජේසිංහ*
**Mississauga - Canada**



## තෙමඟුල

තරුමල් විසිරුණු අහස් විමානෙන්
වෙසක් සඳේ රන් කිරණ සැලේ
බුද්ධගයාවේ බෝමැඩ අසලින්
බුදුරැස් මාලා නැගී දිලේ

කපිලවස්තුවේ මහ සල් වනයේ
පින්බර සිදුහත් කුමරු උපන්නේ
සසර පිරූ පින් සිහි කරමින්නේ
වප්මඟුලේ දී බවුන් වඩන්නේ

පුරා සයවසක් ගත දුක් දුන්නේ
එයින් පලක් නැහැ අතැර දමන්නේ
මැදුම් පිළිවෙතට සිත යොමු වන්නේ
සම්මා සම්බුදු පදවි ලබන්නේ

පුරා වසර පන්සලිස මුළුල්ලේ
දහම් දෙසා සිත් නිවූ ඇසිල්ලේ
හොවා තෙදියතම දුක් කඳුලැල්ලේ
වැඩියා පිරිනිවන් නිවි සැනසිල්ලේ

♦ *මහාචාර්ය උපුල් රංජිත් හේවාවිතානගමගේ*
**London**

## වෙසක් පැතුමක්

බුදු සාමිනේ !
ඔබගේ දහම් කඳ අඩුවෙලා නම් නෑ
සීමා සයුරු මැඩ
නුහුරු රටවල් වලද පැතිරිලා
එදා වාගේ මැයි
එක කන් පෙතක වැද
අනෙක් කනින් පිටවෙලා යනවා
බුදු සාමිනේ !
බණ කතා ජාතකද ඔබ දුටු
දහම් රත්නාවලියෙ වාගේ
කිසිදු වෙනසක් නෑ
පැරණි නම්ගම් වෙනස් කරලා
නැවත ලිවිය හැකියි
බුදු සාමිනේ !
එදා වාගේ මැයි
මිහිරි බණ දෙසන සවුන්
හා දහම් සර සිය දහක් වේ
ඒත් ඔබ සිටි දිනයෙ වාගේ
දමේ සරනා සතුන් කෝ
අපට මග පෙන්වනු මැනේ !

♦ **Dr** *වික්‍රම්ප්‍රිය පෙරේරා*
**USA**

## සුදෝවුන් රජු මෙසේ කියයි !

මැඩගෙන සියලු රජවරු සක්විති ඔටුණු
ප ළ දි න දිනය ගැන තිබුණට පෙර ලකුණු
හ රි මි න ඒ සිරි අලුයම කෙළ පිඩසෙ කුණු
දැනගෙන සිටිම් යන බව තපසට පුතණු

ගැවසෙන නොහැර නිති සෙවනැල්ලක් ලෙසට
නොසිතන කිසිදු අහිතක් බිම්බා දුවට
කි ය මි න සිතැඟි සමුගෙන රහසින් අපට
දැ න ගෙන සිටිම් පුත ඔබ යන බව වලට

සැරසෙන ලෙසට ගමනට රැ ලැබුණු අණ
පිළිගෙන සදන ලද කන්ථක අසු පිටින
එළිවෙන කලින් නිහඬව චන්නත් රැගෙන
දැනගෙන සිටිම් යන බව කොටු පවුරු පැන

ලැබගෙන නුවණ නිවනට යන මඟ පහ දා
වැජඹෙන සසර ගොර බියකරු මරු පර දා
බු දු ව න පිණිස රාහුල පුතු ඉප දුණු දා
දැනගෙන සිටිම් යන බව රජ ගෙය හැර දා

♦ *වෛද්‍ය උපාලි අබේසිරි*
**Middx UK**

## ආවර්ජනා

සංසාර පුරුදු ළඟ සැරිසැරුව අනන් තේ
තරු ලකුණු මහ කියූ පියවරක දිගන් තේ
සිහිකරමි මතකයන් විසිරගිය දසන් තේ
සිහිනයකි නිමාවුණු සුවඳ මල් වසන් තේ

ක්ෂේමභූමියක හෝ කිහිරිහුරු කතර කදි
ඉරිතැළුණු පිය නහා නොමසැලී ගිය මගදි
නොයා අතුපාරවල සෑජු මගේ යන විටදි
සුබ දසුන් පෙර නිමිති හමුවුණේ ඉඳ හිටදි

සඳ රැසින් ජීවිතය කවියක්ව හැඩ වුණේ
හිරු රැසින් චණ්ඩබව එඩියක්ව මතු වුණේ
පිණිබිඳක සිසිලසින් මුදු හැඟුම් ඔප වුණේ
සොබාදම් මැණිගෙන් දෙවන වර ඉප දුණේ

දරු පෙමට සෙනෙහසින් ආදරය පිදු හිතයි
උන් සිනා දකින්නට මුළු දිවිය කැප කළයි
වැහි පබළු වැටෙන විට ගහ කොළද දළු නගයි
මල් පිපී එක හිතින් සුවඳ ලෝකෙට බෙදයි

සසරකින් සසරකට ගෙනාදේ සුවි සේස
කවියක්ව ලියැවෙන්නෙ ඒ අරුම අභි සේස
ලොව සියළු අභිමාන කවිකමට අව සේස
සරස්වතියගෙ බැල්ම ලැබූ ධනයයි සේස

♦ *පද්මා කුරුප්පු* **Paris France**